# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2160/64 - 2020 පෙබරවාරි මස 01 වැනි සෙනසුරාදා - 2020.02.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (5) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය යටතේ ඇති විෂයයන්ගේ පහත කාර්යයන් දේශීය වෛද්‍ය සේවා රාජ්‍ය අමාත්‍යවරයාට පවරන බව මෙයින් සඳහන් කරමි.

නීතිඥ පවිත්‍රා වන්නිආරච්චි (පා. ම.),
සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍ය,
කාන්තා හා ළමා කටයුතු සහ සමාජ
ආරක්ෂණ අමාත්‍ය.

2020 ජනවාරි මස 29 වැනි දින,
සුවසිරිපාය,
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10,
සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ දී ය.

1A - G 31849 — 370 (2020/02)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය

**දේශීය වෛද්‍ය සේවා රාජ්‍ය අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 1. ත්‍රිපෝෂ හා විශේෂයෙන් කිරි දෙන මව්වරුන් සඳහා පෝෂණ ගුණයෙන් යුතු ආහාර සැපයීම බෙදහැරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | 1. සීමාසහිත ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම | • ආයුර්වේද පනත (1961 අංක 31) |
| 2. පාරම්පරික වෛද්‍ය ක්‍රම සංරක්ෂණය සහ වැඩිදියුණු කිරීමට පියවර ගැනීම | 2. ආයුර්වේද දෙපාර්තමේන්තුව | • හෝමියෝපති පනත (1970 අංක 7) |
| 3. ආයුර්වේද, සිද්ධ, යුනානි හා හෝමියෝපති ඖෂධ නිෂ්පාදනය | 3. ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථා | |
| 4. ආයුර්වේද, සිද්ධ, යුනානි හා හෝමියෝපති වෛද්‍ය ක්‍රමවලට අවශ්‍ය අමු හා නිෂ්පාදිත ඖෂධ ආනයනය, විකිණීම හා බෙදාහැරීම | 4. ආයුර්වේද වෛද්‍ය සභාව | |
| 5. ආයුර්වේද, සිද්ධ, යුනානි ආදී දේශීය වෛද්‍ය ක්‍රම වැඩිදියුණු කිරීම සඳහා අදාළ රෝහල්, පර්යේෂණ හා පුහුණු ආයතන සහ ඖෂධ වෙළඳසැල් පිහිටුවීම හා කළමනාකරණය | 5. ආයුර්වේද විද්‍යාල සහ රෝහල් මණ්ඩලය | |
| 6. ඖෂධ පැළැටි හා සකස් කළ ආයුර්වේද, සිද්ධ හා යුනානි ඖෂධ අපනයනය නියාමනය කිරීම | 6. ආයුර්වේද ශික්ෂණ හා පර්යේෂණ රෝහල් | |
| 7. ආයුර්වේද ඖෂධ නිෂ්පාදකයන් නියාමනය කිරීම | 7. හෝමියෝපති රෝහල - වැලිසර | |
| 8. ඖෂධ පැළැටි වගාව ප්‍රවර්ධනය කිරීම හා දේශීය ඖෂධ වර්ග වැඩි දියුණු කිරීම ආශ්‍රිත ව්‍යාපෘති අදළ ආයතන සම්බන්ධීකරණය කරමින් ඉටුකිරීම | 8. හෝමියෝපති වෛද්‍ය සභාව | |
| 9. ආයුර්වේද නිෂ්පාදකයන් ආයුර්වේද වෛද්‍ය වෘත්තිකයන් හා ආයුර්වේද අතුරු වෛද්‍ය සේවක පිරිස් ලියාපදිංචි කිරීම | 9. වකුගඩු අරමුදල | |
| 10. ආයුර්වේද රෝහල්, ආයුර්වේද පර්යේෂණ ආයතන, පුහුණු ආයතන සහ ඔසුසල් පිහිටුවීම, මෙහෙයවීම සහ ප්‍රවර්ධනය | | |

*උපලේඛනය (සම්බන්ධිතයි)*

**දේශීය වෛද්‍ය සේවා රාජ්‍ය අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 11. දේශීය වෛද්‍ය සේවයේ පරිපාලනය සහ පිරිස් කළමනාකරණ කටයුතු සහ දේශීය වෛද්‍ය සේවය ජාත්‍යන්තර පිළිගැනීමක් ඇති කිරීම | | |
| 12. ආයුර්වේද වෘත්තිකයින් සඳහා උසස් අධ්‍යාපන අවස්ථා ලබා දීම | | |
| 13. ආයුර්වේද, සිද්ධ, යුනානි සහ හෝමියෝපති වෛද්‍ය ක්‍රම සංවර්ධනය හා නියාමනය කිරීම සහ දේශීය වෛද්‍ය සේවා සපයන වෛද්‍යවරුන් හා ඔවුන්ගේ සේවා පහසුකම් උසස් ප්‍රමිතියකට පත්කිරීම දිරිගැන්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | | |

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.